**2022 අගෝස්තු මස19 වන දින පැවති**

**පනස් දෙවන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

**දිනය :-2022.08.19**

**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**වේලාව :- පෙ.ව 10.00**

**සහභාගී වූ :-**

| | | | |
|---|---|---|---|
| **01.** ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **02.** ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ). |
| **03.** ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **04.** ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **05.** ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **06.** ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **07.** ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **08.** ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **09.** ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **10.** ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **11.** ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **12.** ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **13.** ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| **14.** ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණි බංඩාර මැ.තිනිය | ( එ.ජා.ප) |
| **15.** ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | (එ.ජා.ප) |
| **16.** ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |

**දන්වා සහභාගී නොවූ:-**

| | | |
|---|---|---|
| **17.** ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **18.** ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රිමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| **19.** ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **20.** ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණි බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |
| **21.** ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |

**නිළධාරීන්:-**

| | |
|---|---|
| **01.** ලේකම් ( වෙනුවට) | අයි.ජී.සී.එන්.වීරකෝන් මිය |
| **02.** විෂය භාර කළමණාකරන සේවා නිළධාරී | කේ.ජී.ඒ සම්මානි මෙය |

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින්, ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**2022.07.19 වන දින මහ සභා කෙටුම්පත් වාර්ථාව**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022.07.19 දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2022.07.19 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

සංශෝධන

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ගෙවීම් වාර්ථා වල පරිපාලන වියදම්, සේවක වැටුප්, මන්ත්‍රී දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා තමන් විරුද්ධ යනුවෙන් සිදු කරන ලද ප්‍රකාශය අන්තර් ගත වී නොමැති බව ප්‍රකාශ කරන ලදි.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ඉදිරිපත් වූ සංශෝධනයන්ට යටත්ව 2022.07.19 වන දින පැවති මහ සභාවේ වාර්ථාව සංශෝධන වලට යටත්ව සභා සම්මත කිරීම සුදුස බවට ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022.07.19 වන දින මහ සභා රුැස්වීම් කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

**අ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදනය.**

01. නාගරික ප්‍රදේශ වල වාහන නැවතීමේ හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022 ජූනි මස 7 වන දින පාර්ලිමේන්තු සංකීර්ණයේ දී නාගරික සංවර්ධන අධිකාරියට අදාළව පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව රැස්වීමේදී ලබාදුන් නාගරික ප්‍රදේශවල වාහන ගාල් කිරීම හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සම්බන්ධව අදාළ පළාත් පාලන ආයතන හා ඒකාබද්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබා දෙන ලද බවත්, ඒ අනුව ඒ ඒ පළාත් ආයතන වලට අදාල ප්‍රධාන නගර වලට ඉහත පහසුකම් ලබාදීම සඳහා සුදුසු ස්ථාන පිළිබඳව සමීක්ෂණයක් කිරීමටත් ඒ මගින් ව්‍යාපෘති යෝජනාවක් සකස් කර 2023 වර්ෂයේ දී භාණ්ඩාගාර මුදල් ප්‍රතිපාදන වෙන් කර ගැනීමට ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට මෙම අධිකාරිය විසින් තීරණය කර ඇති බවත් , මෙහිදී දැනට පවතින පහසුකම් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවයක් ඇත්නම් ඒ පිළිබඳව ද සලකා බලනු ලබන බවත්,ඉහත අවශ්‍යතාවය සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ පළාත් පාලන ආයතනය තුළ ඇති ප්‍රධාන නගර කේන්ද්‍ර කරගෙන වාහන නැවතුම් පොළවල් හා සනීපාරක්ෂක පහසුකම් ව්‍යාපෘති නිර්මාණය කර ඉදිකිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා සුදුසු ස්ථාන හෝ ඉඩම් පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් මේ සමග අමුණා ඇති ආකෘතියට අනුව 2022 වර්ෂයේ අගෝස්තු මස විසි වෙනි දිනට ප්‍රථම ලබා දෙන ලෙසටත් දන්වා සිටින ලදී.

මෙම ආකෘතිය තවමත් සම්පූර්ණ කර යවා නොමැති බවත් ,මෙවැනි ස්ථාන අප ප්‍රාදේශීය සභාව සතු නොවුනත්, අප ප්‍රාදේශීය සභාව සතුව පවතින ත්‍රීවිල් රථ ගාල් කිරීමේ ස්ථාන පිළිබඳව දැනුවත් කරන ලෙසට ප්‍රකාශ කරන ලදී. එවැනි ස්ථාන ලෙසට කුඩා නෙළුබැව, හතේ ඇල, කවරක්කුලම, කලත්තෑව, ශ්‍රාවස්තිපුර, පොතානේගම වැනි ස්ථාන ඉදිරිපත් කළ හැකි බවට ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා තුරුලිය සෙවන බොජුන් හල අසල වැසිකිළි පද්ධතියක් අවශ්‍යයයි මීටපෙර දැනුවත් කළ තිබූ බවත්, මෙම ව්‍යාපෘතිය යටතේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කරන නිසාත්, එම වැසිකිළි පද්ධතිය ලබා ගැනීම සඳහා මෙම ව්‍යාපෘතියට යෝජනා කිරීම සුදුසු යැයි ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා තුරුලිය සෙවන බොජුන් හල අසලට වැසිකිළි පද්ධතියක් ලබා ගැනීමේ එම යෝජනාව මෙම ව්‍යාපෘතිය සඳහා සුදුසු බවත්, ඒ සඳහා කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා රථවාහන ගාල් කරන ස්ථාන තුළ සිදුකරන මෙම සනිපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ යෝජනාව කාලෝචිත අදහසක් බවත්, වර්තමානයේ දී වාහන ගාල් කිරීමේ බොහෝ ගැටළු රාශියක් පවතින බවත්, ක්‍රමවත් ලෙස වාහන ගාල් නොකිරීම නිසා වාහන තදබදයක් පවතින බවත්, රිය අනතුරු බහුලව සිදුවන බවත්, වාහන සඳහා සොර සතුරන්ගෙන් පීඩා එල්ල වන බවත් ප්‍රකාශ කරන ලදී. එහිදී අප ප්‍රාදේශීය සභාව සතුව පවතින ස්ථාන ලෙසට නෙළුබැව රෝහල අසල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසල වාහන වැඩි ලෙස පවතින නිසාත්, මෙම ස්ථාන දෙක අසල විධිමත් ක්‍රමානුකූලව සකස් කරන ලද රථගාල් දෙකක් සකස් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඒ සඳහා ඉදිරියේ දී කටයුතු සිදු කරන බවට ප්‍රකාශ කරන ලදී.

**ආ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**නැත.**

**ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**නැත.**

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. 2022 පෙබරවාරි මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022 සැප්තැම්බර් මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අදාල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**2022 සැප්තැම්බර්**

| | | පැය ගණන |
|---|---|---|
| 01. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 40 |
| 02. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 40 |
| 03. එම්.එස්.එම් ගුණවර්ධන මිය | (කළ: සේවා නිළධාරී) | 60 |
| 04. කේ.ජී.ඒ සම්මානි මෙය | (කළ.සේවා නිළධාරී) | 40 |
| 05. එම්.ඒ.දිසානායක මිය | (කළ.සේවා නිළධාරී) | 40 |
| 06. ඩී.යූ.දිසානායක මයා | (කළ.සේවා නිළධාරී) | 40 |
| 07. කුමුදු වාසනා වීරසිංහ මිය | (කළ සහකාර (ආවරණ) | 40 |
| 08. ටී.එච්.ආර් තාරක මයා | (කළ සහකාර (ආවරණ) | 40 |
| 09. ඒ.ඒ පියතිස්ස මයා | (මා.කම්කරු (මුරකරු ආවරණ) | 40 |
| 10. ඩබ්.එස්.එස්.ඒ.පෙරේරා | (රියදුරු) | 75 |
| 11. ඩී.එම්.ගුණරත්න බංඩා | ( වැඩ පරිපාලක) | 75 |
| 12. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 40 |
| 13. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 40 |
| 14. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 40 |

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව **මැතිතුමා** 2022 සැප්තැම්බර් මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2022 සැප්තැම්බර් මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**02. ප්‍රදේශයේ කසළ බදු අය කිරීම සඳහා වන සමීක්ෂණය සඳහා සහා සේවකයන් නොවන පිටස්තර පුද්ගලයින් යොදා ගැනීම හා ඔවුන්ට දීමනාවක් ලබාදීම සඳහා එක් නිවසකින් රුපියල් 50 බැගින් මුදලක් රැස්කර ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා සභා බල ප්‍රදේශයේ වරිපණම් බදු අය කිරීම සඳහා ගැසට් කර ඇති ග්‍රාම නිලධාරී තුලාන් හය හා පහත ප්‍රදේශ අන්තර්ගත විය යුතු බව පවසන ලදි.

- කලත්තෑව සිට කවරක්කුලම දක්වා මාර්ගය දෙපස මීටර් 200 ක ප්‍රමාණය
- කවරක්කුලම සිට විජයපුර දක්වා මීටර් 200 ක ප්‍රමාණය
- කුරුණෑගල ශ්‍රාවස්තිපුර මාර්ගයේ මීටර් 200 ක ප්‍රමාණය
- ශ්‍රාවස්තිපුර සිට අතුරුවැල්ල දක්වා මීටර් 200 ක ප්‍රමාණය
- නමයෙ ඇල සිට හතේ ඇල තුරුවිල 104 මාර්ගය දක්වා මීටර් දෙසීයක ප්‍රමාණය
- තුරුවිල හන්දියේ සිට තුරුවිල ගම අවසානයේ දක්වා මීටර් දෙසිය ප්‍රමාණය
- කුඩා නෙළුබෑව සිට ජනහිත හන්දිය පසු කරමින් අතුරු වෙන දක්වා මාර්ගය මීටර් 200 ක ප්‍රමාණය
- කුඩා නෙලුම්කුලම හංදියේ සිට නුවර වැව මාර්ගය දක්වා මීටර් 200 ක ප්‍රමාණය
- කුරුණෑගල හන්දියේ සිට පණ්ඩුලගම දක්වා මාර්ගය මීටර් 200 ක ප්‍රමාණය

මෙම කාර්යය ඉටුකර ගැනීම සඳහා සමීක්ෂණ කමිටුවක් පත්කර බල ප්‍රදේශයේ උගත් තරුණ තරුණියන් 20ක ගේ කණ්ඩායමක් යොදා ගනිමින් කටයුතු කිරීම හා ඒ සඳහා එක් නිවසක් සඳහා රුපියල් 50 ක මුදලක් ගෙවීමට අනුමැතිය ලබා ගැනීමත් එම එක් කරන ලද රුපියල් 50 ක මුදලින් යොදාගත් බාහිර පිරිස වෙත වැටුප් ගෙවීම සඳහා කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා අප ප්‍රාදේශීය සභාව සතුව කසල ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා වැඩ පිළිවලක් තිබේද යන්න ප්‍රශ්නයක් ඉදිරිපත් කරන ලදී. එමෙන්ම මෙම කසල බදු එකතු කිරීමේ වැඩසටහනට ප්‍රථමයෙන් ප්‍රාදේශීය සභාව සතු කසල එකතු කිරීමේ වාහන සකස් කර ගැනීම සිදු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

බල ප්‍රදේශයේ තවත් විශාල ගැටළුවක් ලෙසට යහලේගම පාරේ පාසල් සිසුන් ප්‍රවාහනය කරන බස් රථය සඳහා ගමන් කිරිමට අපහසු බවත්, දෙපස වැවී ඇති ගස් වල අතු වැදි ධාවනයට බාධා එල්ල වන බව මේ සඳහා මෙම පාර දෙපස සුද්ද පවිත්‍ර කර සකසා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා වර්තමානයේ අප ප්‍රාදේශීය සභාව තුළින් කසල ප්‍රතිචක්‍රීකරණය කිරීමේ වැඩසටහනක් සිදු නොකරන බවත්, අප සභාව තුළින් එක්රැස් වන කසළ මේ වන විට මහ නගර සභාව වෙත ලබාදෙන බවත්, ප්‍රාදේශීය සභාව සතුව කසල රැස්කිරීමට ට්‍රැක්ටර් දෙකක් පවතින බවත්, නමුත් ඉන් එක ට්‍රැක්ටරයක් අනෙකුත් වැඩ සඳහා ද යොදා ගන්නා නිසා නව ට්‍රැක්ටරයක් මිලදී ගැනීමට හැකි බවත්, ට්‍රැක්ටර් දෙකක් යොදා ගැනීම ප්‍රමාණවත් නොවන්නේ නම්, පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත මේ වන විට ආදායම් උත්පාදනය සඳහා ට්‍රැක්ටරයක අවශ්‍යතාවය අප පෙන්වා දී ඇති බවත්, එය ලබා ලබාගැනීමට හැකිවන බවත් ප්‍රකාශ කරන ලදී.

පාරවල් දෙපස ගස් සහ ඉලුක් වැඩිවීම බල ප්‍රදේශයේ බොහෝ ස්ථානවල පවතින බවත්, තරියන්කුලම බන්ටි එකේ ද මෙම ගැටලුව ඉතා දැඩිව පවතින බවත්, එම පාරවල් දෙපස සුද්ද කිරීම සඳහා ප්‍රාදේශීය ප්‍රාදේශී සභාවේ සේවකයන් ප්‍රමාණවත් නොවන බවත්, මන්ද මෙය අඩුම වශයෙන් මාසෙකට දෙවරක් වත් කැපිය යුතු බවත්, මේ සඳහා කොන්ත්‍රාත් පදනමින් සේවකයන් යොදා ගත යුතු බවත්, ඉදිරියේ දී මේ සඳහා වැඩපිළිවෙළක් යොදන බවත් ප්‍රකාශ කරන ලදී

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> බලප්‍රදේශයෙන් වරිපනම් අය කර ගැනීම සඳහා ගැසට් කර තිබුනත් වරිපණම් බදු අය කර නොගන්නේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය නිසා ද යන්න හා කසල බදු අය කරන්නේ ද යන්න ප්‍රශ්න කරන ලදී. තවද අප බල ප්‍රදේශයේ සෞඛ්‍ය සඳහා සෘජුවම බලපාන කරුණක් ලෙස කසළ ගැටලුව පෙන්වා දිය හැකි බවත්, එහිදී LRC ව්‍යාපෘතිය යටතේ ස්ථාන කීයක කොම්පෝස්ට් ව්‍යාපෘතිය සිදුවන්නේද යන්නත් විමසන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ප්‍රදේශයේ වරිපණම් බදු අය කර නොගන්නේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය නිසා බවත්, කසල බදු වර්තමානයේ දී අය කරන බවත්, කසල බදු මුදල මුදල එක් නිවසකින් එක් මාසයක් සඳහා රුපියල් සීයක් වන බවත්, නමුත් වරිපණම් බදු මුදල් නිවසින් නිවසට වෙනස් වන බවත්, සියලුම නිවෙස් කසළ දීම සඳහා ලියාපදිංචි වී නොමැති බවත්, ඔවුන්ගේ පෞද්ගලික අවශ්‍යතා මත පමණක් කසල බදු ගෙවා කසළ නිකුත් කරන බවත්, නමුත් ඉදිරියේදී සියලුදෙනාම කසල බදු ගෙවා කසළ නිකුත් කිරීම සඳහා යොදාගන්නා බවත්, ප්‍රකාශ කරන ලදී. LRC ව්‍යාපෘතිය යටතේ අප බල ප්‍රදේශයේ ස්ථාන දෙකක එම වැඩසටහන ක්‍රියාත්මක කරන බවත් පවසන ලදී.

<u>ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා</u> ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් අප බලප්‍රදේශය ක්‍රියාත්මක කරන ලද කාබනික පොහොර නිෂ්පාදන ස්ථාන දෙකක් පවතින බවත්, නාච්චාදූව සහ යහලේගම එම ස්ථාන දෙක පිහිටා ඇති බවත්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට මෙය ක්‍රියාත්මක කිරීමට අපහසු වී ඒවා ගුවන් හමුදාවට හා සිවිල් ආරක්ෂක බලකායට ක්‍රියාත්මක කිරීම පවරා ඇති බවත්, එහිදී සමහර ඉඩම් සතුව භූමියේ ගැටලු සහ පවරාගැනීමේ ගැටලු පැවති බවත්, නාච්චාදූව කාබනික පොහොර මධ්‍යස්ථානය සතුවද එවැනි ගැටලුවක් පැවති බවත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය</u> ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරනු ලද බවත්, නගර සභාව විසින් අපෙන් බාරගන්නා ලද කසල සඳහා මුල් කාලයේදී මාසෙකට ලක්ෂ තුනක වැනි මුදලක් ගෙවූ නමුත් වර්තමානයේ එය ගෙවන්නේ ද යන්න විමසන ලදී. එසේ මුදලක් නොගෙවන්නේ නම්, කසළ එකතු කිරීම සඳහා අප ප්‍රාදේශීය සභාව සතුව වැය වන ඩීසල් වියදමවත් ලබාගත යුතු බවත්, මන්ද එක්රැස් කරන ලද කසලවලින් ඔවුන්ට ආදායමක් ඉපයිය හැකි බවත් පෙන්වා දෙන ලදී. එසේ නොවන්නේ නම් ප්‍රාදේශීය සභාව සතුව කසල අංගනයක් සාදාගත හැකි බවත්, එහිදී එක් රැස් වන කසළ ප්‍රතිචක්‍රීකරනය කරගත හැකි බවත්, තමන් ඒ සඳහා ව්‍යාපෘති වාර්තාවක් ලබාදීමට සූදානම් බවත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> කසල නගර සභාවට ලබා දෙන්නේ ප්‍රාදේශීය සභාව සතුව කසල දැමීමට ස්ථානයක් නොමැති නිසා බවත්, වර්තමානයේ පවතින තත්ත්වය මත ඒ ආකාරයට නගර සභාව වෙත කසල ලබාදීමේ ගැටලුවක් නොමැති බවත්, එය තේරුම් ගැනීම සඳහා ගරු මන්ත්‍රීවරුන් සතුව පවතින අනවබෝධය පිළිබඳව තමා කනගාටු වන බවත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ප්‍රදේශයේ කසළ බදු අය කිරීම සඳහා වන සමීක්ෂණය සඳහා සභා සේවකයන් නොවන පිටස්තර පුද්ගලයින් යොදා ගැනීම හා ඔවුන්ට දීමනාවක් ලබාදීම සඳහා එක් නිවසකින් රුපියල් 50 බැගින් මුදලක් රැස්කර ගැනීම ක්‍රියාත්මක කිරීම සුදුසු බවට වූ යෝජනා ව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**03. 2022 වර්ෂය සඳහා වන අයවැය ප්‍රතිපූරක ඇස්තමේන්තුව**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා 2022 වර්ෂය සඳහා වන අයවැය ප්‍රතිපූරක ඇස්තමේන්තුව ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලදි.

ගරු උප සභාපති එම්.සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා 2022 වර්ෂය සඳහා වන අයවැය ප්‍රතිපූරක ඇස්තමේන්තුව සම්මත කිරීම සම්බන්දව ගරු සභාපති තුමා විසින් සිදු කල යෝනාව ස්ථිර කරන ලදි.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022 වර්ෂය සඳහා වන අයවැය ප්‍රතිපූරක ඇස්තමේන්තුව සම්මත කිරීමේ යෝජනා ව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මිත විය

**04. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන, දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා පෞද්ගලික උපකාරක පන්ති නියාමනය කිරීම සඳහා වූ යෝජනාව.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා මෙම යෝජනාව ගරු කුමාරසිංහ මන්ත්‍රී තුමා විසින් ඉදිරිපත් කර ඇති බවත්, මෙම යෝජනාවට අනුව පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන, දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා පෞද්ගලික උපකාරක පන්ති නියාමනය කිරීම පිලිබඳව සවිස්තරාත්මක විස්තරයක් ඉදිරිපත් කිරීම සඳහා ගරු කුමාරසිංහ මන්ත්‍රීතුමාට අවස්ථාව ලබාදෙන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා සමාජයේ දැඩිව පවතින අවශ්‍යතාවයක් වෙනුවෙන් මෙම යෝජනාව සභාවට ඉදිරිපත් කළාට ස්තුතියි වන බවත්, මේ ජාතික ප්‍රශ්නයක් ව පවතින බවත්, මෙම යෝජනාව ඉදිරිපත් කරන ලද්දේ ද්වේෂසහගත මට්ටමෙන් නොවන බවත් , පෙර පාසල් දරුවන්ගේ සහ පාසල් දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳව සිතා බවත් ප්‍රකාශ කරන ලදී.

වර්තමානයේ පෙර පාසල් ගත් විට විවිධ ආයතන විසින් පවත්වාගෙන යනු ලබන පෙර පාසල් පවතින බවත්, එහිදී රාජ්‍ය නොවන සංවිධාන මඟින් පවත්වාගෙන යන පෙර පාසල් ද, පූර්ව ළමාවිය සංවර්ධන මණ්ඩලයේ අධීක්ෂණය යටතේ පවතින පෙර පාසල් ද, පළාත් පාලන ආයතනය විසින් පවත්වාගෙන යන පෙර පාසල් ද, පරිවාස දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ යටතේ පවත්වාගෙන යනු ලබන පෙරපාසල්ද පවතින බවත්, මෙම පෙර පාසල් තුලින් තෝරාගන්නා ලද එකම විෂය නිර්දේශයක් තුළින් අධ්‍යාපනය ලබා දෙන්නේද යන්න ගැටළුවක් පවතින බවත්, උපකාරක පන්ති තුළද නිසි ප්‍රමිතියක් පවතින්නේ ද යන්න ගැටළුවක් පවතින නිසාත් තමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැතිනිය එම යෝජනාව ඉතා හොඳ යෝජනාවක් වන අතර තමා විසින් එය ස්ථිර කරන ලද බවත්, මෙය කාලෝචිත ගැටලුවක් බවත්, වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ පූර්ව ළමාවිය සංවර්ධනය නිසියාකාරව සිදු නොවීම නිසා ගැටළු ඇති වී ඇති බවත්, ජපානය වැනි රටවල කුඩා කල සිටම නිසි පරිදි ළමුන්ට ඉගෙනීම් කටයුතු සිදුකරන බවත්, අප බල ප්‍රදේශය තුළ ද මෙම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන මෙන්ම උපකාරක පන්ති නියාමනය කිරීමේ මෙම වැඩසටහන සිදු කිරීම යහපත් බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා වර්තමානයේ පෙර පාසල් හා උපකාරක පන්ති තුළ සනීපාරක්ෂක පහසුකම් හා ආරක්ෂාව නිසි ලෙස නොමැති බවත්, බෝවන රෝග පාලනය සඳහා නිවැරැදි ක්‍රමවේද නොපවතින බවත්, බොහෝ උපකාරක පන්ති තුළ වර්තමානයේ ප්‍රමාණවත් ඉඩකඩක් නොපවතින බවත්, මෙය අධ්‍යාපනය හැදෑරීම සඳහා විශාල ගැටළුවක් බවත්, උපකාරක පන්ති තුල උගන්වන ලද ගුරුවරුන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරුවරයෙක් ලෙස පත්වීමත් නොලද පුද්ගලයින්ද සිටින බවත්, සාමාන්‍යයෙන් පෙරපාසල් පැවතිය යුත්තේ 2km අතර තුළ එක් පෙර පාසලක් බවත් නමුත් වර්තමානයේ මෙම

නියාමනයෙන් බැහැරව අක්‍රමවත් ලෙස පෙර පාසල් විහිදී ඇති බවත්, අවම වශයෙන් පෙරපාසලක සෙල්ලම් උපකරණ දහයක්වත් පැවතිය යුතු බවත්, පෙර පාසල් තුල ඉගෙනුම් රටාව ගත් විට නියමිත විෂය නිර්දේශය යටතේ අධ්‍යාපනය ලබා නොදෙන බවත් ප්‍රකාශ කරන ලදී. තවත් විශාල ගැටළුවක් ලෙස ආබාධිත දරුවන් පෙර පාසල් සහ දිවාසුරැකුම් මධ්‍යස්ථාන වලට නොගැනීමද වර්තමානයේ දක්නට ඇති බවත්, 1994 දී ස්පාඤ්ඤයේ සලමන් නගරයේ ලෝක නායකයින් එක්ව " අන්තර්කරණ අධ්‍යාපන ප්‍රඥප්තිය" අත්සන් කර ඇති අතර ශ්‍රී ලංකාවද එයට අත්සන් තබා ඇති නිසා, ඒ ආකාරයෙන් ආබාධිත දරුවන් හට වෙනසක් සිදුකිරීම නීතියානුකූල නොවන බවත් , අද ගොළු බිහිරි පාසල් පවා වර්තමානයේ රට තුළ තුල පැවතුනත් එය නීතිය අනුකූලව සිදු නොවිය යුතු දෙයක් බවත්, ආබාධිත දරුවන්ද අනෙකුත් දරුවන් සේම එකම පාසලක අධ්‍යාපනය ලැබිය යුතු බවත්, අප බල ප්‍රදේශයේ ද මෙය ක්‍රියාත්මක නොවුනත් පෙර පාසල් සහ උපකාරක පන්ති නියාමනය තුලින් ඉදිරියට ආබාධිත දරුවන් සඳහා ද සම අයිතිවාසිකම් ලබා දීමෙන් ආදර්ශයක් ලබා දිය හැකි බවත් පවසන ලදී. තවද ආබාධිත දරුවන්ගේ සංඥා භාෂා ආදී පිළිබඳව සමාජයේ පුද්ගලයන්ගේ දැනුවත්භාවය අඩු නිසා සමාජයේ අනෙකුත් පුද්ගලයන් දැනුවත් කරමින් වැඩමුළුවක් පැවැත්වීම සුදුසු බවත්, මෙය පාසල් මට්ටමින් හා සමාජයේ මට්ටමින් සිදු කළ හැකි බවත්, ප්‍රකාශ කරන ලදී.

අප බල ප්‍රදේශයේ බොහෝ උපකාරක පන්ති හා කණ්ඩායම් පන්ති පවතින බවත්, මෙම කණ්ඩායම් පන්ති වල සිටිය යුතු අවම සිසුන් ප්‍රමාණය අප තීරණය කළ යුතු බවත්, උපකාරක පන්ති වල අධ්‍යාපනය පිළිබඳව ඍජු අධීක්ෂණයක් සිදු කළ යුතු බවත්, ඒවායේ පවතින පහසුකම් පිළිබඳව ද සොයා බැලිය යුතු බවත් ඒවා නිසියාකාරව නියාමනය විය යුතු බවත්, මේ සඳහා නියමිත නීතිරීති ක්‍රියාත්මක කළයුතු බවත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා</u> ගරු කුමාරසිංහ මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ඉතා හොඳ යෝජනාවක් බවත්, වර්තමානයේ දී දිවා සුරකුම් මධ්‍යස්ථාන, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හා උපකාරක පන්ති යන ඒවා නිසි ලෙස නියාමනය නොවී පවතින බවත්, ඒවා නියාමනය කිරීම අත්‍යවශ්‍ය බවත් පවසන ලදි. කුඩා කල සිටම දරුවාගේ අධ්‍යාපනය වර්ධනය සඳහා පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන අත්‍යවශ්‍ය බවත්, දරුවන්ගේ ආරක්ෂාව උදෙසා දිවා සුරකුම් මධ්‍යස්ථාන අත්‍යවශ්‍ය බවත්, දරුවන්ගේ ඉදිරි අධ්‍යාපනය සඳහා උපකාරක පංති අත්‍යවශ්‍ය බවත් පැවසූ අතර වර්තමානයේ දී මේවා තුල ගැටළු පැනනැගී ඇති බවත් , රටේ පාලනය සිදු කරන පුද්ගලයින් විසින් මේවා සඳහා නිසි ලෙස විසඳුම් ලබා දිය යුතු බවත් පවසන ලදී.

ආබාධිත දරුවන් සහ අනෙකුත් දරුවන්ට සමාන අවස්ථාවන් ලබා දී එකට එක් වී අධ්‍යාපනය ලබාදීම සුදුසු බවත්, මෙම ආයතන වෙත සභාවක් ලෙස එකට එක්වී ඔවුන්ගෙන් මුදලක් අය කරනවාද? එසේත් නැතිනම් සභාවක් ලෙස අප යම් පහසුකමක් එම ආයතන වෙත සලසනවා ද? යනුවෙන් අවසන් වශයෙන් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා</u> මෙම යෝජනාව ඉතා හොඳ යෝජනාවක් බවත්, මෙය ක්‍රියාත්මක කිරීමේ දී ගැටලු හෝ අඩුපාඩු තැන් ඇතිවිය හැකි බවත්, නමුත් ඒ සඳහා ගරු සභාපතිතුමා ඉතා වගකීමෙන් යුතුව කටයුතු කරන බවත්, සෑම දෙමාපියෙකුගේම වගකීම වනුයේ දරුවන් හොඳින් රැක බලා ගැනීම මෙන්ම ඉතා හොඳ අධ්‍යාපනයක් ලබාදීම බවත් , එවිට රටේ අනාගතය වෙත ඉතා බුද්ධිමත් පිරිසක් බිහිවන බවත්, ඒ සඳහා දායක වන ස්ථාන ලෙස මෙම යෝජනාව තුළින් ඉදිරිපත් කර ඇති, දිවා සුරකුම් මධ්‍යස්ථාන, උපකාරක පන්ති හා පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන නිසි ලෙස ක්‍රියාත්මක විය යුතු බවත්, සමාජයේ විවිධ මට්ටම් වල දරුවන් සිටින බවත්, එම දරුවන්ගේ තේරුම් ගැනීම විවිධාකාර බවත් සියලුම දරුවන්ට තේරුම් ගත හැකි ආකාරයට ඉගැන්විය යුතු බවත්, දරුවාගේ මානසික මට්ටමට නිවසේ පරිසරය බලපාන බවත්, ඒ අනුව මෙම ස්ථාන නියමාකාරව නියාමනය විය යුතු බවත්, අංගසම්පූර්ණව සහා බල ප්‍රදේශය වෙත දිවා සුරකුම් මධ්‍යස්ථාන දෙකක් වත් අප දියයුතු බවත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු උප සභාපති එම්.සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන, දිවා සුරකුම් මධ්‍යස්ථාන හා උපකාරක පන්ති නියාමනය කිරීමේ යෝජනාව ඉතා කාලෝචිත යෝජනාවක් බවත්,

ඉතිහාසයෙදි දිවා සුරකුම් මධ්‍යස්ථාන නොපැවතියද වර්තමානයේ දී කාන්තා පාර්ශවය රැකියා කිරීමට යොමු වීමත් සමග දරුවන්ගේ ආරක්ෂාව උදෙසා දිවා සුරකුම් මධ්‍යස්ථාන සමාජය වෙත අත්‍යවශ්‍ය කාරණයක් බවත්, දරුවා පාසලට යැමට ප්‍රථමව පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වෙත ඇතුලත් කරන නමුත් දරුවාට එහිදී නිසි දැනුමක් ලබා දෙනවාද යන්න සොයා බැලිය යුතු බවත්, ප්‍රාදේශීය සභාවක් වශයෙන් අප හා එම ආයතන අතර සම්බන්ධතාවයක් පැවතිය යුතු බවත්, ජාතික මට්ටමින්, රාජ්‍ය මට්ටමින් හා ප්‍රාදේශීය වශයෙන් ද නිසියාකාරව මේවා නියාමනය විය යුතු බවත් පවසන ලදි.

දිවා සුරකුම් මධ්‍යස්ථාන ද ක්‍රමානුකූලව ව්‍යාප්ත වී ජාතික මට්ටම දක්වා වර්ධනය වී ඇති බවත්, මේවා ද නිසියාකාරව සංවර්ධනය කළ නියාමනය කළ යුතු බවත්, උපකාරක පන්ති ගත් විට වර්තමානයේ බොහෝ තැන්වල ව්‍යාප්ත වී ඇති බවත්, මේවායේ නිසියාකාර පහසුකම් පවතිනවාද යන්න හා උගන්වන ගුරුවරයා රාජ්‍ය මට්ටමින් පිළිගත් අයෙක්ද යන්න සොයා බැලිය යුතු බවත් ඒ අනුව උපකාරක පන්ති නියාමනය ද අත්‍යවශ්‍ය කාරණයක් බවත් පවසන ලදී. ආබාධිත දරුවන් සඳහා වර්තමානයේ බොහෝ පාසල් වල වෙනම පන්ති කාමර පවතින බවත්, එම දරුවන් හට ඉගැන්වීම් රටාව වෙනස් වන බවත්, ආබාධිත දරුවන්ගේ මානසික තත්ත්වයන් තේරුම් ගත යුතු බවත්, ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සහ ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන් විසින් ආබාධිත දරුවන් උදෙසා විශාල වැඩපිළිවෙළක් සිදුකර ඇති බවත්, එම වැඩසටහන් වර්තමානයේ දීත් ක්‍රියාත්මක වන බවත්, ඒ සඳහා එතුමන්ලා වෙත ගෞරවය පුද කරන බවත්, දරුවන්ගේ අනාගතය උදෙසා මෙම ආයතන නිසියාකාරව නියාමනය කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය</u> මෙය ඉතා හොඳ කාලෝචිත වටිනා යෝජනාවක් බවත්, දිවා සුරකුම් මධ්‍යස්ථාන හා පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වලට වඩා පෞද්ගලික උපකාරක පංති නියාමනය කිරීම ඉතා අත්‍යවශ්‍ය බවත්, මන්ද වර්ථමානයේදී බහුලව උපකාරක පන්ති දැකගත හැකි බවත්, ඒවා නිසි ප්‍රමිතියෙන් යුක්තව ක්‍රියාත්මක වන්නේ ද යන්න සොයා බැලිය යුතු බවත්, වර්තමානයේ බොහෝ උපකාරක පන්ති තුළ ආකර්ෂණීය කතාබහ තුළින් ශිෂ්‍යන් ගෙන්වා ගන්නා බවත්, වර්තමානයේ උපකාරක පන්ති කඩ තුළ සිසුන්ට ගැලපෙන පරිදි භෞතික සම්පත් පවතින්නේ ද යන්න ගැටළු සහගත බවත්, එහි දී දරුවන්ගේ ආරක්ෂාව පවතින්නේ ද යන්න සොයා බැලිය යුතු බවත්, උගන්වන ගුරුවරයා නියමාකාර ගුරුවරයෙක් ද යන්න සොයා බැලිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. දිවා සුරකුම් මධ්‍යස්ථාන වර්තමානය සඳහා ඉතා අත්‍යවශ්‍ය ආයතනයක් බවත්, මෙම යෝජනාව ඉතා හොඳ යෝජනාවක් නිසා අතුරු ව්‍යවස්ථාවක් සාදා නියාමනය කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> උපකාරක පන්ති පිළිබඳව කතා කිරීමට අකමැති බවත්, වර්තමානයේ උපකාරක පන්ති වැඩි වූ නමුත් උගතුන්ගේ වැඩිවීමක් සිදුවී නොමැති බවත්, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන තුළ නිසියාකාර නියාමනයක් සිදු කළ යුතු බවත්, ඒවායේ නිශ්චිත විෂය නිර්දේශයක් පවතින අතර ඒ අනුව ඉගෙනුම් කටයුතු සිදු කරනවාද යන්න ඉතා ඉක්මනින් සොයා බැලිය යුතු බවත්, එහිදී පෙර පාසල් ගුරුවරියන් කැඳවා නියාමනයට එකඟ ද යන්න විමසිය යුතු බවත්, වර්තමානයේ කාන්තාවන් රැකියා සඳහා යොමු වීමත් සමඟ දිවා සුරකුම් මධ්‍යස්ථානය සමාජයට අත්‍යවශ්‍ය බවත්, නමුත් මේ තුළදී දරුවාට නිසි සෞඛ්‍ය ආරක්ෂිත බවක් හා ආරක්ෂාවක් ලැබෙනවාද යන්න සොයා බැලිය යුතු බවත්, උපකාරක පන්ති තුළදීද දරුවන්ට නිසි ආරක්ෂාවක් මෙන්ම දරුවන්ට අවශ්‍ය වන පරිදි මූලික පහසුකම් තිබේද යන්න සොයා බැලිය යුතු බවත් පවසන ලදී. වර්තමානයේ දී දරුවන් පරිහානියට පත්වී ඇති බවත්, අන්තර්ජාලය වැනි සමාජ ජාලා තුළින් මේ තත්වය උදා වී ඇති බවත්, ඒ අනුව දරුවන් නිසියාකාරව යොමු කිරීම සඳහා මෙම නියාමනය කිරීමේ යෝජනාව ඉතා හොඳ යෝජනාවක් බවත්, පෙර පාසල් ගුරුවරුන් තෝරා ගැනීමේදී මනෝවිද්‍යාව පිළිබඳ පුහුණුවක් ලද ගුරුවරුන් ද යන්න සොයා බැලිය යුතු බවත් ඒ තුළින් දරුවන් හට යහපත් අනාගතයක් උදා වේවි යනුවෙනුත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> ගරු බන්දුලසේන මන්ත්‍රීතුමා විසින් පූර්ව ළමාවිය සංවර්ධනන මධ්‍යස්ථාන සඳහා විෂය නිර්දේශයක් පවතින බව ප්‍රකාශ කල නමුත්, එහි පවතින්නේ මාර්ගෝපදේශයක් පමණක් බවත්, වර්තමානයේ දී ඌව පළාතේ පමණක් ප්‍රඥප්තියකින් විෂය නිර්දේශය නියාමනය කර ඇති

බවත් ප්‍රකාශ කරන ලදී. ගුරු කුමුදුනි බස්නායක මන්ත්‍රීතුමිය විසින් සිදුකරන ලද අතුරු ව්‍යවස්ථාවක් ආධාරයෙන් නියාමනය කිරීමේ යෝජනාව ඉතා හොඳ යෝජනාවක් බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා මෙම යෝජනාව ඉතා හොඳ යෝජනාවක් මේ සඳහා කිසිදු ගැටළුවක් නැති බවත්, රටක් වශයෙන් මෙය සිදුවිය යුතු බවත්, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වෙත යොමු කරන ලද ගුරුවරුන් සඳහා නිසියාකාර පුහුණුවක් ලබා දිය යුතු බවත්, එම ස්ථාන වල ප්‍රමිතිය පිළිබඳව සොයා බැලිය යුතු බවත්, උපකාරක පන්ති තුළින් දරුවන්ගේ මනස විකෘති කරන බවත්, නිසි ලෙස උපකාරක පන්ති ඉතා ඉක්මනින් නියාමනය කළ යුතු බවත්, මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා ගරු කුමුදුනි බස්නායක මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලද අතුරු ව්‍යවස්ථා යෝජනාව ඉතා හොඳ යෝජනාවක් බවත්, එය ඊළඟ මහ සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත්, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන, දිවා සුරකුම් මධ්‍යස්ථාන හා උපකාරක පන්ති නියාමනය කිරීමේ මෙම ව්‍යාපෘතිය යටතේ ඉරිදා දිනවල දී උපකාරක පන්ති තැබීම තහනම් කළ යුතු බවත්, මෙම ව්‍යාපෘතිය ගරු ජනාධිපතිතුමා හා ගරු අගමැතිතුමා දක්වා දැනුවත් කිරීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන, දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා පෞද්ගලික උපකාරක පන්ති නියාමනය කිරීම සඳහා වූ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය

**05.** ආයතනික පුහුණුව සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍යාවක් මාස 6 ක් සඳහා බඳවා ගැනීම.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා අංක 380, අභය මාවත, විජයපුර ලිපිනයේ පදිංචි කේ.කේ.තරුෂිකා මදුවන්ති යන විශ්ව විද්‍යාල ශිෂ්‍යාව මාස 6 ක ආයතනික පුහුණුවක් සඳහා බඳවා ගන්නා ලෙසට ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කර ඇති බව ගරු මහ සභාවට පවසන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය එම විශ්ව විද්‍යාල ශිෂ්‍යාව මාස 6 ක ආයතනික පුහුණුවක් සඳහා බඳවා ගැනීම සඳහා ගරු සභාපති තුමන් විසින් සිදු කල යොජනාව ස්ථිර කරන ලදි.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ආයතනික පුහුණුව සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍යාවක් මාස 6 ක් සඳහා බඳවා ගැනීම සඳහා වූ යෝජනා ව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2022 අගෝස්තු මස 08 වන දින මුදල් කමිටු වාර්ථාව

**සභා ගත කරන ලදී.**

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2022 ජූලි මස ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ගෙවීම් වාර්ථා වල පරිපාලන වියදම්, සේවක වැටුප්, මන්ත්‍රී දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා තමන් විරුද්ධ බව ප්‍රකාශ කරන ලදී.

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

**01. නිවාඩු දැනුම් දීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු මන්ත්‍රී එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය ,ගරු මන්ත්‍රී ආර්.එම්.අයි ජනක ශ්‍රිමාලි මැතිනිය ,ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා ,ගරු මන්ත්‍රී වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා ,ගරු මන්ත්‍රී එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු වසන්ති මැතිණිය</u> අදාල නිවාඩු ඉල්ලුම් කර ඇති ගරු සභිකවරුන් වෙත නිවාඩු ලබා දීම සුදුසු බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> ප්‍රාදේශීය සභාවේ සිටිය ලේකම්තුමා ස්ථාන මාරුවක් ගෙන ගියේ කුමන හේතුවක් නිසාද? සත්‍ය ලෙසම එතුමන් අතින් හොරකමක් සිදු වූවාද? එම සිදුවීම සිදුවන අවස්ථාවේ එතුමන් තනිව කටයුතු කළේද? යනුවෙන් හා ප්‍රධාන කළමනාකරණ සහකාර තමියට ලේකම් බලතල පැවරීමට ගරු සභාපති තුමන් සතුව බලයක් පවතිනවා ද යන්න විමසන ලදී.

<u>ගරු සභාපති එස්. බී කුමාරදාස මැතිතුමා</u> අපි ප්‍රාදේශීය සභාවේ සිටිය ලේකම්තුමා හොරකමක් සිදු කළා යැයි නොකියන බවත්, එම අවස්ථාවේ එතුමන් තනි ව නොසිටි බවත් තවත් කිහිප දෙනෙකු ඒ අවස්ථාවේ සිටි බව පිළිගන්නා නමුත් ආයතනයක් තුළ පැවතිය යුතු නීතිරීති වලට පටහැනිව සිදු කළ ක්‍රියාවක් නිසාත් මෙම ලොරි රථයේ රියදුරු විසින් තමා ලිඛිතව දැනුවත් කිරීමෙන් පසු පළාත් පාලන කොමසාරිස්තුමන් දැනුවත් කරීමෙන් අනතුරුව ලේකම් තුමා ස්ථාන මාරු කර ඇති බවත්, ප්‍රධාන කළමනාකරණ සහකාර තමියට ලේකම් බලතල පැවරීමට ගරු සභාපති තුමන් සතුව බලයක් පවතින බවත් ප්‍රකාශ කරන ලදී.

ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රිතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රිතුමියන්ලා වෙත ස්තූතිය ප්‍රකාශ කරමින් 2022.08.190වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 12.30 ට අවසන් කරන ලද අතර එළබෙන මහ සභාව 2022.09.16 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.

.................................... ..........................................

එස්. බී කුමාරදාස,

ලේකම්,
නැ. නු. ප ප්‍රාදේශීය සභාව,
විජයපුර.

සභාපති ,
නැ. නු. ප්‍රාදේශීය සභාව,
විජයපුර.